# මැතිවරණ කොමිෂන් සභාව

## தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.slelections.gov.lk* *e-mail : info@slelections.gov.lk*

මගේ අංකය : PE/2020/15 ඔබේ අංකය : දිනය : 2020.07 10
எனது இல. உமது இல. திகதி

සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත

**පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05**
**කායික දුබලතාවයෙන් යුතු තැනැත්තන් සඳහා ඡන්ද මධ්‍යස්ථානයට ඇතුළුවීමේ දොරටුවේ සිට ඡන්ද මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ල දක්වා ත්‍රීරෝද රථ මඟින් ප්‍රවාහන පහසුකම් සැලසීම.**

යම්කිසි කායික දුබලතාවයක් නිසා පයින් යාම් ඊම් කළ නොහැකි තැනැත්තෙකුට ඡන්ද මධ්‍යස්ථානය පිහිටි භූමියේ ප්‍රධාන පිවිසුම් දොරටුවේ සිට ඡන්ද මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ල දක්වා ත්‍රීරෝද රථ මඟින් ප්‍රවාහන පහසුකම් සලසා දීමට අවශ්‍ය කටයුතු සැලැස්විය යුතුය. මේ සඳහා පහත කරුණු සම්පූර්ණ විය යුතුය.

1.1 ඡන්ද මධ්‍යස්ථානයේ පිවිසුම් දොරටුවේ සිට ඡන්දය පවත්වනු ලබන ගොඩනැගිල්ල දක්වා ඡන්ද මධ්‍යස්ථානය තුළ ත්‍රීරෝද රථයකින් ගමන් කළ හැකි දුර ප්‍රමාණය මීටර් 100 කට වඩා වැඩි විය යුතුය.

1.2 කඳු සහ පඩි විශාල සංඛ්‍යාවක් ඇති දුෂ්කර ඡන්ද මධ්‍යස්ථානයක ඉහත 1.1 හි සඳහන් දුර ප්‍රමාණය මීටර් 100 ට වඩා අඩු අවස්ථාවකදී යොදා ගත හැක.

1.3 කායික දුබලතාවයක් නොමැති කිසිදු තැනැත්තෙකු ප්‍රවාහනය නොකළ යුතුය.

02. එවැනි පහසුකම් සැලසිය යුතු ඡන්ද මධ්‍යස්ථාන වෙත මෙන්ම, විධිමත් පරිදි අයදුම්පත් ලබා දී ඇති දුබලතාවයෙන් යුත් පුරවැසියන් සිටින බවට තහවුරු කරගත් ඡන්ද මධ්‍යස්ථාන වෙතද ඡන්ද පොල තුළ යාම ඊම සඳහා ත්‍රීරෝද රථයක් යොදා ගැනීමට ග්‍රාම නිලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කරන්න.

03. එසේම මෙම කාර්යය සඳහා යොදා ගන්නා ත්‍රීරෝද රථයේ රියදුරු හා මගීන් වෙන්වනසේ ඉටි කොළයකින් වෙන්කර තිබීමත් රියදුරු මුඛ ආවරණ පැළඳ සිටීමත් හා කිසිම පක්ෂ දේශපාලන ක්‍රියාකාරිකයෙකුට හෝ අපේක්ෂකයෙකුට අයත් නොවන හා එම රථයේ වර්ණයද යම් කිසි දේශපාලන පක්ෂයකට අයත් නොවන ත්‍රීවිල් රථයක් සොයා ගතයුතු අතර, එම රථය ග්‍රාමනිලධාරි වසමේ බල ප්‍රදේශය තුලින් යොදවා ගත යුතුය.

04. එමෙන්ම මෙම කාර්යය සඳහා යොදාගන්නා ත්‍රීරෝද රථයේ රියදුරු වෙත ආයතන සංග්‍රහය විධිවිධාන අනුව අවම සංයුක්ත දීමනාවක් හා මගේ අංක TR/PE/01/2020 හා 2020.07.06 (PE/2020/TR- 9 චක්‍රලේඛය අනුව) දිනැති ලිපියේ 08 වන ඡේදයේ සඳහන් පරිදි එදිනට රු1000/- ක දීමනාවක් ගෙවිය හැක. එම මුදල ග්‍රාම නිලධාරි මඟින් අදාළ ත්‍රීරෝද රථයේ රියදුරු වෙත ගෙවීමට කටයුතු කර, එම මුදල් ප්‍රතිපූරණය කිරීම සඳහා ග්‍රාම නිලධාරිගේ වවුචරය සමඟ අදාළ රියදුරුගෙන් මුදල් භාරගත් බවට ලිපියක් ලබාගෙන ඉදිරිපත් කල පසු ග්‍රාම නිලධාරිට ගෙවීමට කටයුතු කළ යුතුය.

05. ත්‍රීරෝද රථ යෙදවීමට පෙර පූර්ව අනුමැතිය දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ලබා ගත යුතුබව කාරුණිකව දන්වමි.

රසික පීරිස්
අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)
මැතිවරණ කොමසාරිස් ජනරාල් වෙනුවට

පිටපත් :-1. ලේකම් මැතිවරණ කොමිෂන් සභාව - ECP/20/22(12) සහ 2020.06.17 දිනැති නියෝගය පරිදි කාරුණික දැන ගැනීම සඳහා

2. ප්‍රධාන මූල්‍ය නිලධාරි - දැන ගැනීමට හා අවශ්‍ය කටයුතු සඳහා කාරුණිකව

සභාපති
தவிசாளர்
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
*e-mail : comelect@sltnet.lk*

ලේකම්
செயலாளர்
දුරකථන/தொலைபேசி : 011-2868406
ෆැක්ස්/தொலைநகல் : 011-2868406
*e-mail : admin@slelections.gov.lk*